# රහස්‍යතා ප්‍රතිපත්තිය

මෙම රහස්‍යතා ප්‍රතිපත්තියෙහි (“ප්‍රතිපත්තිය”), අපි, Qualcomm Incorporated සහ අපගේ පරිපාලිත සමාගම් (සාමූහිකව “අපි”, “අප”, හෝ “අපගේ”) විසින්, අප පුද්ගලික දත්ත රැස් කරන, භාවිත කරන, සකසන, සහ මාරු කර ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු සපයන්නෙමු. Qualcomm Incorporated සහ අපගේ පරිපාලිත සමාගම් (නෛතික පැවැත්ම) අප විසින් කළමනාකරණය කරනු ලබන දත්ත, ව්‍යාපාර ක්‍රියාවලි, සහ ලෝකය වටා දිවෙන තොරතුරු පද්ධති හුවමාරු කර ගන්නා ගෝලීය සංවිධානයක් වන්නෙමු. එම නිසා, මෙම ප්‍රතිපත්තියෙහි කටයුතු සඳහා, අප අපට අදාළ වන, බොහෝ ප්‍රතිපත්තිමය සහ දත්ත ආරක්ෂණ නීති ආවරණය කිරීමට "පුද්ගලික දත්ත” යන යෙදුම වඩාත් පුළුල් ලෙස භාවිත කරමු; “පුද්ගලික දත්ත” යන්න ස්වභාවික පුද්ගලයෙකු හඳුනා ගැනීමට හෝ ස්වභාවික පුද්ගලයෙකු හඳුනා ගැනීමට සාධාරණ ලෙසින් භාවිත කළ හැකි (ඒවා තනිවම හෝ වෙනත් සාධාරණ ලෙසින් ලද හැකි දත්ත හා ඒකාබද්ධව) තොරතුරු හා ආශ්‍රිත දත්ත අර්ථවත් කරයි.

# විෂය පථය

මෙම ප්‍රතිපත්තිය හෝ මෙම ප්‍රතිපත්තිය ඇතුළත අප යොමු දක්වන (සාමූහිකව “සේවා”) අපගේ වෙබ් අඩවි, නිෂ්පාදන, සේවා, මෘදුකාංග, හෝ යෙදුම් මත සෘජු සබැඳියක් දක්වන අවස්ථා සමඟ අදාළ කර ගැනේ. මෙම ප්‍රතිපත්තිය සේවා හරහා රැස් කර ගන්නා දත්ත පමණක් ආවරණය කරන අතර ඔවුන්ගේම, රහස්‍යතා ප්‍රතිපත්ති නඩත්තු කරන අනෙකුත් සේවාවල දත්ත රැස් කිරීම් පරිචය ඇතුළුව එහෙත් ඊට සීමා නොවී, වෙනත් කවර හෝ දත්ත එකතුවක් හෝ සැකසුම් කිරීමක්, ආවරණය නොකරයි. අවස්ථානුරූපීව, සමීක්ෂණ සහ විශේෂ කාර්ය වෙබ් පිටු, උදාහරණ වශයෙන්, අපගේ සේවානියුක්තික වෙබ් පිටු, කරා සම්බන්ධිතව මෙම ප්‍රතිපත්තිය කරා අප යොමු දක්වමු; එවැනි කාරණාවල දී, මෙම ප්‍රතිපත්තිය නියමිත දැන්වීම තුළ නවීකරණය කර ඇති පරිදි හෝ කැමැත්ත ඉල්ලා සිටීම (උදා. රැස් කරන ලද දත්ත වර්ගවලට ආශ්‍රිත හෝ රැස්කිරීමේ අභිප්‍රායවලට අදාළව) සමඟ අදාළ වෙයි.

# දත්ත ආකාර සහ රැස් කිරීමේ විධික්‍රම

පහත දැක්වෙන මාර්ගවලින් අපි පුද්ගලික දත්ත විවිධත්වයක් රැස් කරමු. අප රැස් කරන දත්ත පිළිබඳව ඔබට තෝරා ගැනීමේ විකල්ප තිබේ. අපට තොරතුරු සපයන ලෙස ඔබගෙන් ඉල්ලා ඇතිවිට දී ඔබ මේවා ඉදිරිපත් නොකිරීමට තේරිය හැක්කෙහිය. නමුත් ඔබ දත්ත සැපයීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, අදාළ නිෂ්පාදනය හෝ සේවාව භාවිත කිරීමට ඔබට ඇති හැකියාව හීන වී යාම හෝ සීමා කරනු ලැබීම විය හැකිය.

**ඔබ ඉදිරිපත් කරන දත්ත.** ඔබ අපෙන් තොරතුරු ඉල්ලා සිටින විට, ලියාපදිංචි කිරීමක්, නිෂ්පාදනයක් හෝ සේවාවක් ඇණවුම් කරන විට, හෝ අන් ආකාරයක අදහසක් ඇතිව එවැනි තොරතුරු අප කරා එවන විට, අපි ඔබගේ නම, ඊමේල් ලිපින(ය), තැපැල් ලිපින(ය), දුරකථන අංක(ය), සහ ඔබ නියෝජනය කරන ව්‍යාපාරය හා සම්බන්ධ දත්ත රැස් කරමු. ගාස්තු අය කරන සේවා හා සම්බන්ධයෙන්, අපි ගෙවීම් තොරතුරු (උදා. ණය කාඩ්පත් අංකය සහ සම්බන්ධිත සත්‍යාපන දත්ත), දුරකථන අංකය, සහ බිල්පත්කරණ සහ ප්‍රවාහනගත කරන ලිපින වැනි තොරතුරු ද රැස් කරන්නෙමු.

**අප අපගේ වෙබ්අඩවිවලින් ස්වයංක්‍රීයව රැස් කරන දත්ත.** ඔබ අපගේ සේවාවලින් එකකට පිවිසුම් ගන්නා විට, බ්‍රවුසර් වර්ගය, මෙහෙයුම් පද්ධතිය, IP ලිපිනය සහ ඔබ අඩවියට පිවිසුම් ගැනීමට භාවිත කරන වසම් නාමය, සහ ඔබ ඔබගේ ජංගම උපාංගය භාවිත කරමින් අපගේ අඩවියට පිවිසුම් ගන්නේ නම්, ජංගම උපාංගයේ වර්ගය වැනි ඔබගේ පරිගණකය හෝ ජංගම උපාංගය වෙතින් පොදු දත්ත රැස් කරන්නෙමු. ඊට අතිරේකීව, ඔබ අඩවියට පිවිසුණු දිනය සහ වේලාව, ඔබ වෙබ් අඩවියෙහි පිවිසුම් ගත් ක්ෂේත්‍ර සහ පිටු, ඔබ අඩවිය මත ගත කළ කාල ප්‍රමාණ, ඔබ අඩවියට නැවත පැමිණි වාර ගණන සහ ක්ලික් කිරීමෙන් ප්‍රවාහ වූ දත්ත වැනි ඔබ අපගේ වෙබ් අඩවිය භාවිත කළ ආකාරය පිළිබඳ අප දත්ත රැස් කරන්නෙමු.

**කුකීස්.** ඔබ අපගේ වෙබ් අඩවි හෝ වෙබ් යෙදුම් භාවිත කළ ආකාරය පිළිබඳ දත්ත රැස් කිරීමට අපි කුකී, වෙබ් සංඥෙළි හෝ ඒ හා සමාන තාක්ෂණ භාවිත කරමු. කුකියක් යනු ඔබ අඩවියට පිවිසෙන විට ඔබගේ පරිගණකයේ හෝ උපාංගයේ දෘඪ ධාවකය මත රඳවන කුඩා පෙළ ගොනුවකි. අපි අපගේ අඩවි සහ සේවා මෙහෙයවීමෙහි ලා උපකාර වශයෙන් කුකී භාවිත කරමු, ඊට ඇතුළත් වන්නේ: (1) ඔබ නැවතත් අඩවියට පිවිසෙන විට තොරතුරු ඇතුල් කිරීමට අවශ්‍ය නොවන පරිදි එම

තොරතුරු මතක තබා ගැනීම, (2) ඔබට අඩවිය මත රිසිකරණය කළ අන්තර්ගතය සහ පිරිනැමීම් සැපයීම, (3) අඩවි කාර්යසාධනය අධීක්ෂණය කිරීම, පර්යේෂණ පැවැත්වීම, අපගේ අන්තර්ගතය සහ සේවා වැඩිදියුණු කිරීම සඳහා ඒකාබද්ධ සංඛ්‍යාන ගොඩනැගීම, සහ (4) අපගේ අඩවි සහ සේවාවල ආරක්ෂාව සහතික කිරීමට උපකාරී වීම.

එමෙන්ම අපි වෙබ් විශ්ලේෂණ හවුල්කරුවන්, වෙළඳ දැන්වීම්කරුවන්, හෝ වෙළඳ දැන්වීම් ජාල වැනි අනෙකුත් සමාගම්වලට අඩවිය මත තම කුකී හෝ වෙබ් සංඥා (මෙන්ම 1x1 pixel.gif හෝ ක්‍රියාමාර්ග ඇමුණුම් ලෙස ද හඳුන්වන) තැන්පත් කිරීමට හෝ ඒවාට පිවිසුම් ගැනීමට ඉඩ දෙමු. උදාහරණ වශයෙන්, අපි අප වෙනුවෙන් අන්තර්ජාලය පුරා වෙළඳ දැන්වීම් සේවා කිරීමට සහ ඔවුන්ගේ වෙළඳ දැන්වීම් අපගේ අඩවිය මත තැබීමට තෙවන පාර්ශ්ව වෙළඳ දැන්වීම් සමාගම් භාවිත කරමු. මෙම තෙවන පාර්ශ්ව වෙළඳ දැන්වීම් සමාගම් අප ද ඇතුළුව ඔවුන්ගේ සේවාදායකයන්ගේ වෙළඳ දැන්වීම් ඵලදායකත්වය මැනීමේ සහ වැඩිදියුණු කිරීමේ උපක්‍රම වශයෙන් කුකී සහ වෙබ් සංඥා සේවයේ යොදවති. එසේ කිරීමට, මෙම සමාගම් කාලය මුළුල්ලේ අප අඩවියෙහි සහ වෙනත් අඩවිවල ඔබගේ පිවිසුම් පිළිබඳ දත්ත භාවිත කරති. මෙම දත්තවලට බැනර් වෙළඳ දැන්වීම ප්‍රදර්ශනය කරන දිනය/වේලාව, ඔවුන්ගේ කුකීවල අන්තර්ගත අනන්‍ය හැඳුනුම්කාරක අංකයක්, සහ ඔබගේ උපාංගයේ IP ලිපිනය ඇතුළත් විය හැකිය. මෙම දත්ත ඔබට පුද්ගලීකරණය කළ වෙළඳ දැන්වීම් භාවිත කරනු ලැබිය හැකි අතර එනිසා ඔබ ඇලුම්කම් දක්වන භාණ්ඩ සහ සේවා පිළිබඳ වෙළඳ දැන්වීම් දැකීමට වඩාත්ම හැකියාවක් ඇත. ඔබ මෙම පරිචය සහ පුද්ගලීකරණය කළ වෙළඳ දැන්වීම්කරණය සඳහා වන ඔබගේ තේරීම් පිළිබඳ තවත් තොරතුරු ලබා ගැනීමට කැමතියි නම්, මෙම තේරීමෙන් ඉවත් කිරීමේ ලිපිය කරා පිවිසෙන්න.

ඔබට නිදහසේ කුකී ප්‍රතික්ෂේප කළ හැකි නමුත් එසේ කිරීමෙන්, ඔබට අඩවිය මත ඇති ඇතැම් විශේෂාංග භාවිත කිරීමට හැකියාව හෝ අපගේ පිරිනැමුම්වල සම්පූර්ණ වාසිය ගැනීමට හැකියාව නොමැතිව යා හැකිය. ඔබගේ කුකී මනාප වෙනස් කිරීමට හැදෑරීම සඳහා ඔබගේ බ්‍රවුසරයෙහි “උපකාර” මෙනුව පරීක්ෂා කරන්න. තවදුරටත් තොරතුරු සඳහා, කරුණාකර අපගේ කුකී ප්‍රතිපත්තිය බලන්න.

**මෘදුකාංග සහ යෙදුම්:** Qualcomm Incorporated හි පරිපාලිත සමාගම් ජංගම උපාංග කාර්යසාධනය, බැටරි බලය සුරැකීම, උපාංග ආරක්ෂාව වැඩිදියුණු කිරීම, හෝ අනෙක් ප්‍රතිලාභ පිරිනැමීම වැඩිදියුණ� කිරීමට උපකාරී විය හැකි ජංගම උපාංග

සඳහා මෘදුකාංග සහ යෙදුම් පන්තියක් නිර්මාණය කරයි. මෙම මෘදුකාංග යෙදුම් මාර්ගයෙන්, අප පිහිටුම් දත්ත, අනන්‍ය හැඳුනුම්කාරක (චිප් කට්ටල අනුක්‍රමික අංකය හෝ අන්තර්ජාතික දායක හැඳුනුම වැනි), උපාංගය මත ස්ථාපිත සහ/හෝ ක්‍රියාත්මක යෙදුම් පිළිබඳ දත්ත, නිෂ්පාදනය, මාදිලිය, සහ රැහැන් රහිත වාහකය වැනි වින්‍යාසගතකරණ දත්ත, මෙහෙයුම් පද්ධතිය සහ අනුවාද දත්ත, මෘදුකාංග ගොඩනැගුම් දත්ත, සහ චිප් කට්ටලයෙහි කාර්යසාධනය, බැටරි භාවිතය, සහ උෂ්ණත්ව දත්ත වැනි කාර්යසාධනය පිළිබඳ දත්ත රැස් කරනු ලැබිය හැකිය. [වැඩිදුර හදාරන්න]

**තෙවන පාර්ශ්ව මූලාශ්‍ර**: අප දත්ත තැරැව්කරුවන්, සමාජ ජාල, අනෙකුත් හවුල්කරුවන්, හෝ ප්‍රසිද්ධ මූලාශ්‍ර වැනි තෙවැනි පාර්ශ්ව වෙතින් පුද්ගලික දත්ත රැස් කිරීම ද කරනු ලැබිය හැකිය.

# රැස් කිරීමේ අරමුණු, දත්ත භාවිතය

අපි ඔබගේ කැමැත්ත ඇතිව සහ/හෝ ඔබ භාවිත කරන නිෂ්පාදන සැපයීමේ අවශ්‍යතාව, අපගේ ව්‍යාපාරය මෙහෙයවීම, අපගේ ගිවිසුම් සහ නෛතික බැඳියා සපුරාලනු පිණිස, අපගේ පද්ධති සහ අපගේ පාරිභෝගිකයන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කරනු පිණිස, හෝ අනෙකුත් නීත්‍යානුකූල ඇලුම්කම් සපුරාලනු පිණිස, ඔබ පිළිබඳ පුද්ගලික දත්ත රැස් කිරීම සහ සැකසුම් කිරීම කරන්නෙමු. අප දත්ත රැස් කිරීම සහ භාවිත කිරීම සඳහා අරමුණුවලට ඇතුළත් වන්නේ:

- ඔබගේ තොරතුරු ඉල්ලීම්, හෝ සේවාවක් ලබා ගැනීම සඳහා ඔබගේ දායකත්වය දැක්වීම, හෝ නිෂ්පාදනයක් මිලදී ගැනීම වැනි ඔබ විසින් අපට එවනු ලබන ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම;
- ඔබ ඉල්ලන සේවා(ව) සැපයීම, කළමනාකරණය කිරීම, නඩත්තු කිරීම, සහ ඉටු කිරීම;
- පරිපාලනය, ආරක්ෂා කිරීම, සහ අපගේ සේවා සහ අපගේ පද්ධති වැඩිදියුණු කිරීම ඇතුළුව, අපගේ ව්‍යාපාරය මෙහෙයවීම සහ වැඩිදියුණු කිරීම, නව නිෂ්පාදන සහ සේවා සංවර්ධනය කිරීම, සහ අනෙකුත් අභ්‍යන්තර ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කිරීම;
- අපගේ සේවා පරිශීලකයන්ගේ මනාප වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම, අපගේ සේවා භාවිතය පිළිබඳ ඒකාබද්ධ සංඛ්‍යාන සැකසුම් කිරීම, සහ අපගේ

වෙබ් අඩවිය සහ සේවා භාවිතය සඳහා ඔබගේ අත්දැකීම පුද්ගලීකරණය කිරීමට උපකාරී වීම;

- අපගේ තාක්ෂණ විධි, නිෂ්පාදන හෝ සේවා නිකුතු, ප්‍රවෘත්ති, සහ අනෙකුත් සන්නිවේදන පිළිබඳ තොරතුරු ඔබට සැපයීම; සහ
- අප මෙම ප්‍රතිපත්තියෙහි ලා විස්තර කරන වෙනත් කවර හෝ භාවිත හෝ අප දත්ත රැස් කරන අවස්ථාව යනාදියයි.

මෙම අරමුණු සාක්ෂාත් කර ගනු පිණිස, සහ අදාළ නීතිය මගින් අවසර දෙන තාක් දුරට, අප විසින් වෙනස් මූලාශ්‍ර ඇසුරින් රැස් කරන විවිධ දත්ත වර්ග බද්ධ කරනු හැකිය.

# අප දත්ත ගබඩා කිරීම සහ සැකසුම් කිරීම කරන ස්ථානය

අපි එක්සත් ජනපදය සහ ආසියාවේ සහ යුරෝපීය ආර්ථික කලාපයෙහි සීමා කිරීමකින් තොරව, ලෝකය පුරා තිබෙන අපගේ සේවාදායකවල දත්ත ගබඩා කිරීම සහ සැකසුම් කිරීම කරන්නෙමු. මෙම ප්‍රතිපත්තියට අනුසාරී වන පුද්ගලික දත්ත ගබඩා කරන හා සැකසුම් කරන තැන කුමක් වුවත්, අපි මෙම ප්‍රතිපත්තියට සහ අදාළ නීතියට අනුව දත්ත සැකසුම් කෙරෙන බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිකර්ම යොදන්නෙමු.

අපි පුද්ගලික දත්ත සමහරක් සඳහා යුරෝපීය කොමිසම සතුව දත්ත ආරක්ෂණය පිණිස සුදුසු මට්ටමේ ආරක්ෂාව සහතික කර නොමැති විට, යුරෝපීය ආර්ථික කලාපයෙහි සිට වෙනත් රටවල් කරා මාරු කරන්නෙමු. අප එසේ කරන විට, මාරුව බල ගන්වනු පිණිස (ඔබගේ කැමැත්ත හෝ නෛතික ගිවිසුම් වැනි) අපි නෛතික යන්ත්‍රණ සමූහයක් භාවිත කරන්නෙමු.

# පුද්ගලික දත්ත හෙළිදරව් කිරීම්

අපි, Qualcomm (පරිපාලිත සමාගම් ඇතුළුව) ඇතුළත ඔබගේ පුද්ගලික දත්ත කරා ප්‍රවේශය ගන්නා අතර මෙම ප්‍රතිපත්තියෙහි ලා සකසනු ලැබ ඇති අරමුණු මුදුන්පත් කර ගනු පිණිස අප වෙනුවෙන් දත්ත සැකසුම් කරන තෙවන පාර්ශ්ව සේවා සපයන්නන් සමඟත් දත්ත හුවමාරු කරන්නෙමු. අපි අපගේ ව්‍යාපාරික

පාරිභෝගිකයන් පිළිබඳව අපගේ සේවානියුක්තිකයන් සහ සේවකයන් හට පුහුණුව හෝ අනෙකුත් සේවා පිරිනමන්නෙමු. එවැනි කාරණවල දී, අපි අපගේ පුහුණුව සහ අනෙකුත් සේවා භාවිතය සම්බන්ධ දත්ත, හඳුනාගත් ව්‍යාපාරික පාරිභෝගිකයන් සමඟ ඔවුන්ගේ ව්‍යාපාර භාවිතය සඳහා බෙදාගන්නෙමු. එමෙන්ම, අපි, නීතිය මඟින් අවශ්‍ය කරන විට හෝ අපගේ හෝ අන් අයගේ නෛතික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ හෝ ක්‍රියාවට නැංවීමේ අභිරුචිය පරිදි, උදා. නීතිය බලාත්මක කිරීමේ නිලධාරීන් වෙතින් එන ඉල්ලීම් සම්බන්ධයෙන් සහ අධිකරණ නීතිකෘත්‍ය සම්බන්ධයෙන්, එහෙත් ඊට සීමා නොවෙමින්, ඔබගේ දත්ත බෙදා ගැනීම කරන්නෙමු. අනාගත හෝ සත්‍ය විකුණුමක්, ඒකාබද්ධ කිරීමක්, මාරු කිරීමක් හෝ අපගේ ව්‍යාපාරයේ කොටසක් හෝ සමස්තය අනෙකුත් ලෙසින් හඳුනා ගැනීමක් සම්බන්ධයෙන් අප ඔබගේ දත්ත හවුලේ පරිහරණය හෝ මාරු කිරීම කරනු හැකිය. අවසාන වශයෙන්, ඔබ අපට අවසර දී ඇති පරිදි අප ඔබගේ පුද්ගලික දත්ත හවුලේ පරිහරණය කරනු හැකිය.

# ඔබගේ තේරීම්

**තේරීම/තේරීමෙන් ඉවත් කිරීම.** ඊමේල් අලෙවිකරණය වැනි, සමහර අවස්ථාවල දී, අපි සමහර දත්ත රැස් කිරීම්, භාවිතය, හෝ හවුලේ පරිහරණය කිරීම් වර්ග සමහරක් තේරීම හෝ තේරීමෙන් ඉවත් කිරීමේ හැකියාව ඔබට පිරිනමන්නෙමු. එවැනි අවස්ථාවල දී, අපි ඔබගේ තේරීමට ගරු කරන්නෙමු.

දත්ත විෂය හිමිකම්. ඇතැම් රටවල සහ රාජ්‍යයන් වල නීතීන් මගින් ඔබට පිවිසුම් අයැදුම, සංශෝධනය, මකා දැමීම, සීමා කිරීම සහ ඔබගේ පුද්ගලික දත්ත අනුව අනෙකුත් හිමිකම් ලබා දේ. එම හිමිකම් භාවිතය සඳහා මෙතැන ක්ලික් කරන්න.

**ලුහුබැඳීම නොකරන්න.** අපි දැනට වෙබ් බ්‍රවුසර් මගින් යවන “ලුහුබැඳීම නොකරන්න” (“DNT”) සංඥාවලට ප්‍රතිචාර නොදක්වන්නෙමු. DNT සංඥා අර්ථ නිරූපණය කළ යුතු ආකාරය සහ ඒවා ලැබීමට වෙබ් අඩවි සහ තෙවන පාර්ශ්ව මගින් ගත යුතු ක්‍රියා මාර්ගය තීරණය කිරීමට අදාළ කළ යුතු ඒකීය ප්‍රමිතයක් මෙතෙක් සකසා නැත. කෙසේවෙතත්, ඔබගේ බ්‍රවුසර් පසුතලවල කුකී පාලන සහ ඉහත කුකී කොටසෙහි විස්තර කර ඇති පුද්ගලීකරණය කළ වෙළඳ දැන්වීම් පාලන ඇතුළුව, දත්ත රැස් කිරීම සහ භාවිතය පිළිබඳ අනෙකුත් පාලන මාර්ග සමූහයක් ඔබට භාවිත කළ හැකිය.

# රඳවා තබාගැනීම

ඔබගේ ගිණුම සක්‍රීයව පවතිනා අතර, හෝ ඔබට සේවා සැපයීමට අවශ්‍ය කරන තාක් කල් අපි ඔබගේ පුද්ගලික දත්ත රඳවා ගනිමු. රැස් කරන ලද ව්‍යාපාරික අරමුණ සඳහා ඒවා තවදුරටත් අවශ්‍ය නොවන විට, අපි සාධාරණ කාල සීමාවක් ඇතුළත පුද්ගලික දත්ත මකා දමන්නෙමු. අපි, කෙසේවෙතත්, අපගේ නීතිමය බැඳියා හා අනුකූලවීම, ආරවුල් විසඳීම, සහ අපගේ ගිවිසුම් බලාත්මක කරවීම පිණිස, අවශ්‍ය වන පරිදි පුද්ගලික දත්ත රඳවා ගැනීම සහ භාවිතය කරන්නෙමු.

# ආරක්ෂාව

අන්තර්ජාලය හරහා සම්ප්‍රේෂණය කිසිවිටක 100%ක් ආරක්ෂිත හෝ දෝෂ රහිත නොවේ. කෙසේවෙතත්, අපි ඔබගේ දත්ත හානිවීම, අවභාවිතය, සහ අනවසර ප්‍රවේශය, හෙළිදරව් කිරීම, අමුතු කිරීම, සහ විනාශ කිරීම ආදියෙන් ආරක්ෂා කිරීමට සාධාරණ පියවර ගනිමු. ඔබගේ මුරපද සහ පරිශීලක හැඳුනුම් ආරක්ෂා කර ගැනීම සහ අපගේ සේවාවලින් එකක් හා ඔබගේ මුරපදය සහ පරිශීලක හැඳුනුම ආරවුලකට පත්ව ඇති බව ඔබ කවදාක හෝ සැක කරන්නේ නම්, පහත සඳහන් සබඳතා මාර්ගයක් භාවිත කරමින් අපට දන්වා සිටීම ඔබගේ වගකීම වේ. ඔබගේ මුරපදය සහ පරිශීලක හැඳුනුම හරහා අපගේ සේවාවකට අනවසර භාවිතය කිරීම් කිසිවක් වෙතොත් ඒ සඳහා ඔබ පරම වගකීම දරන්නෙහිය.

# ළමුන්ගේ පෞද්ගලිකත්වය

අපගේ සේවා වැඩිහිටියන් සඳහා අදහස් කර ඇත. අපි අදාළ නීතියෙහි අර්ථ නිරූපණය කර ඇති ආකාරයට ළමුන්ගෙන් පුද්ගලිකව හඳුනාගත හැකි තොරතුරු අභිප්‍රාය සහිතව හෝ දැන දැනම රැස් නොකරන අතර ළමුන් අප වෙතින් පුද්ගලික තොරතුරු කිසිවක් ඉදිරිපත් නොකරන ලෙස ඉල්ලා සිටිමු.

# සංශෝධන

අප කවර අවස්ථාවක හෝ මෙම ප්‍රතිපත්තියෙහි කොටස් වෙනස් කිරීම, නවීකරණය කිරීම, එක් කිරීම, හෝ ඉවත් කිරීම සඳහා අයිතිවාසිකම රඳවා ගන්නා නමුත් එය අවසාන වශයෙන් යාවත්කාල කරන ලද දිනය ප්‍රතිපත්තියෙහි දක්වමින් වෙනස්කම්

කර ඇති බව, ඔබගේ සෝදිසියට ලක්වන සේ ඉදිරිපත් කරනු ඇත. අප ප්රමාණාත්මක ආකාරයකින් ප්රතිපත්තිය වෙනස් කරන්නේ නම්, වෙනස් කිරීමට යටත් පිරිසෙයින් දින තිහකටවත් පෙරාතුව, ඔබට මාර්ගගත දැන්වීමක් සැපයීම සහ/හෝ නීතිය මගින් අවශ්ය කරන ආකාරයට ඔබගේ ප්රකාශිත කැමැත්ත ලබා ගැනීම කරනු ඇත. ඔබ අපගේ වෙබ් අඩවිවලට පිවිසෙන්නේ නම් හෝ අපගේ සේවා භාවිත කරන්නේ නම්, ඔබ මෙම ප්රතිපත්තියෙහි ප්රවර්තන අනුවාදය පිළිගන්නෙහිය. කිසියම් වෙනස් කිරීමක් පිළිබඳව හැදෑරීමට පරිශීලකයන්ට අවස්ථානුකූලව මෙම ප්රතිපත්තිය කරා නැවත පිවිසෙන ලෙස අපි නිර්දේශ කරමු.

# අප හා සම්බන්ධ වන්න

අප හා සම්බන්ධ වීමට, privacy[at]qualcomm[dot]com කරා ඊමේල් එකක් එවන්න, නැත්නම්, අවධානය Qualcomm Incorporated වෙත යොමු කර අපට ලියන්න. පෞද්ගලිකත්ව උපදෙස්, 5775 Morehouse Drive, San Diego, CA 92121.

බලාත්මක වන දිනය: අප්රේල් 30, 2019

© 2019 Qualcomm Technologies, Inc. සහ/හෝ එහි අනුබද්ධ සමාගම්.